සැ. යු.-2008.07.11 දින පළ කරන ලද අංක 1,558 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,565 - 2008 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2008.08.29**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1046 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1050 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 සැප්තැම්බර් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 අගෝස්තු මස 22 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.


1043 - B 079934 —9,360 (2008/07)

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරිම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකුලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණත් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු - අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 සැප්තැම්බර් මස 29 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූලි මස 30 වැනි දින,
අංක 234/3ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**තනතුරු ඇබෑර්තු**

***අනුරාධපුර දිස්ත්‍රික්කය :***

| | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම් පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම් පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|---|
| 01. | අනුරාධපුරය | තඹුත්තේගම | මුදුන්ගොඩ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ තඹුත්තේගම කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය. |
| 02. | අනුරාධපුරය | තඹුත්තේගම | පහලගම කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ තඹුත්තේගම කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 03. | අනුරාධපුරය | පලාගල | බටහිර කිරලව කෝරළේ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ කලාගම් පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 04. | අනුරාධපුරය | තිරප්පනේ | දකුණු උලගල්ල කෝරළේ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ හුරුළු පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |

| | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම් පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම් පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|---|
| 05. | අනුරාධපුරය | ගලෙන් බිඳුණු වැව | සීවලීපුර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ හුරුළු පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය. |

08-812

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 සැප්තැම්බර් මස 29 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූලි මස 30 වැනි දින,
අංක 234/3ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**තනතුරු ඇබෑර්තු**

***කෑගල්ල දිස්ත්‍රික්කය :***

| | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම් පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම් පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|---|
| 01. | කෑගල්ල | රඹුක්කන | රඹුක්කන නගර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල. |

08-815

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේළලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 සැප්තැම්බර් මස 29 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූලි මස 29 වැනි දින,
අංක 234/3ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

**මාතර දිස්ත්‍රික්කය :**

| | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම් පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම් පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|---|
| 01. | මාතර | වැලිපිටිය | දෙනිපිටිය කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වැලිගම් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර. |
| 02. | මාතර | මුලටියන | දෙයියන්දර කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ කන්දබඩ පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 03. | මාතර | පස්ගොඩ | බෙරලපනාතර කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ මොරවක් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 04. | මාතර | වැලිගම | මිරිස්ස කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වැලිගම් කෝරළය කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | එම |

08-816

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාස වල විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථාන වල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 සැප්තැම්බර් මස 29 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූලි මස 30 වැනි දින,
234/3ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

| | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|---|
| 01. | පුත්තලම | ආනමඩුව | පෙරවිලිපත්තුව කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ දෙමළ හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |
| 02. | පුත්තලම | වෙන්නප්පුව | මුදුකටුව කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ පිටිගල් කෝරලේ දකුණ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | එම |
| 03. | පුත්තලම | වනාතවිල්ලුව | පොම්පරිප්පු පත්තු බටහිර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ කල්පිටිය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | එම |
| 04. | පුත්තලම | මුන්දලම | කන්දතොඩුවාව, සින්නපාඩු කොට්ඨාසයේ උප්පැන්න, හා මරණ සහ පුත්තලම් පත්තු විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | එම |
| 05. | පුත්තලම | කල්පිටිය | කල්පිටිය කොට්ඨාසයේ උප්පැන්න, මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරය | එම |

08-814

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු හම්බන්තොට දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාස වල විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථාන වල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 සැප්තැම්බර් මස 29 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූලි මස 30 වැනි දින,
234/3ඒ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේදී ය.

| | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|---|
| 01. | හම්බන්තොට | සූරියවැව | උතුරු වලකඩ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ මාගම් පත්තුව විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට. |

08-813

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2007**

මෙම නිවේදනයේ "ලේකම්" යන පදයෙන් අදහස් කෙරන්නේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ය. "සේවය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ ශ්‍රී ලංකා පරිපාලන සේවය යි.

1. *ලිඛිත විභාගය.*—මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

(i) සාමාන්‍ය පරිපාලනය
(ii) මුදල් රෙගුලාසි
(iii) විෂයානුබද්ධ අධ්‍යයනය

*විභාග දිනය.*—මෙම විභාගය 2008 නොවැම්බර් මස කොළඹ නගරයේ දී (නගර අංක 01) හා යාපන නගරයේ දී (නගර අංක 02) පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් වලට යටත්ව ලේකම්ට බලය ඇත. මේ අනුව විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා නගර අංකය නිවැරදිව ඉල්ලුම්පත්‍රයේ අදාළ ස්ථානයේ සටහන් කරන්න. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට කිසිසේත්ම ඉඩදෙනු නොලැබේ.

*සම්මුඛ පරීක්ෂණය.*—ලිඛිත විභාගයේ සියළුම ප්‍රශ්නපත්‍රවලට පෙනී සිටි සෑම ප්‍රශ්න පත්‍රයකටම 40% ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූද, අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගත්තා වූද, අපේක්ෂකයන් සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ලේකම් විසින් තීරණය කරනු ඇත.

2. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

3. *සේවා කොන්දේසි.*—රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද, (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1419/3 සහ 2005.11.14 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද) 2005.10.28 වැනි දින දරන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධන වලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු සේවයේ III වන පන්තියට පත් කරනු ලැබේ.

3.1 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බලය ඇත.

4. ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය :-

විශේෂ ශ්‍රේණිය - රු. 42,390 - 12 x 1.310 - රු. 58,110
I වැනි පන්තිය - රු. 36,755 - 17 x 1,050 - රු. 53,555
II වැනි පන්තිය - රු. 30,175 - 8 x 790 - රු. 35, 705
III වැනි පන්තිය - රු. 22,935 - 10 x 645 - රු. 28,385

(පත්වීමේ දින සිට වසර 03 ක් ඇතුළත 1 වැනි කාර්යක්ෂමතා කඩඉම හා පත්වීමේ දින සිට වසර 06 ක් ඇතුළත II වැනි කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.)

මෙම විභාගය මඟින් බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තිය සඳහා වේ.

5. *සුදුසුකම්.*—මෙම ජේදයේ අවසානයේ ඇති සටහන් වල විධිවිධානයන්ට යටත්ව

අ. (i) පහත සඳහන් සේවා/ශ්‍රේණි වල ස්ථිර කරන ලද රජයේ නිලධාරියෙකු වන : සහ

(ii) එවැනි සේවා/ශ්‍රේණි එකක් හෝ ඊට වැඩි ගණනක හෝ අවු 10 කට නොඅඩු අඛණ්ඩ ස්ථිර සේවයේ නියුතුව සිටින : හෝ

ආ. (i) පහත සඳහන් සේවා/ශ්‍රේණි වල ස්ථිර කරන ලද රජයේ නිලධාරියෙකු වන හා එවැනි සේවා/ශ්‍රේණි එකක හෝ ඊට වැඩි ගණනක හෝ අවු 05 කට නොඅඩු අඛණ්ඩ ස්ථිර සේවයේ නියුතුව සිටින : හා

(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු වීම.

සටහන : (අ) උපාධිය බලපවත්නා දිනය අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර දිනයක් විය යුතු අතර එදිනට හෝ ඊට පෙර ඉහත 5 අ (i) සහ (ii) හෝ 5 (ආ) (i) සහ (ii) හි දැක්වෙන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් ද යුක්ත විය යුතුය.

(ඇ) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

*සේවා හා ශ්‍රේණි* :

(i) ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පාලනය යටතේ වන පහත සඳහන් ඕනෑම ඒකාබද්ධ සේවයකට අයත් නිලධාරියෙකු :
රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්, භාෂා පරිවර්තක, පුස්තකාලයාධිපති.

(ii) පහත සඳහන් ඕනෑම ලිපිකරු සේවයකට අයත් නිලධාරියෙකු :
තැපැල් දුම්රිය, පාර්ලිමේන්තු, පාසැල්, රජයේ මුද්‍රණාලය, සෞඛ්‍ය

(iii) පහත සඳහන් ඕනෑම දෙපාර්තමේන්තු ශ්‍රේණියක නිලධාරියෙකු හෝ එවැනි ශ්‍රේණියක සේවය කොට පසුව පළාත් රාජ්‍ය සේවයේ සමාන ශ්‍රේණියකට අන්තර්ග්‍රහණය කළ නිලධාරියෙකු

| *දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ* | *ශ්‍රේණි* |
|---|---|
| සියලුම අමාත්‍යාංශ | සහකාර ලේකම් (ශ්‍රී ලං.ප.සේ නොවන) මහජන සම්බන්ධතා නිලධාරි |
| තරුණ කටයුතු අමාත්‍යාංශය<br>ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය | සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා)/ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි, ක්‍රීඩා නිලධාරි |
| මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය<br>ප්‍රතිපත්ති ක්‍රම සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව | ව්‍යාපෘති නිලධාරි, සංඛ්‍යාන මිනුම් නිලධාරි,<br>සංඛ්‍යාන සහකාර, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ නිලධාරි |
| ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරි, බලයලත් නිලධාරි |
| පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) |
| ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | සංඛ්‍යා ලේඛන විමර්ශක |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | රෝහල් ලේකම් |
| ආයුර්වේද දෙපාර්තමේන්තුව | විමර්ශන නිලධාරි |
| සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය<br>සමාජ සේවා දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුමය), සුභසාධන හා සමාජ සුභසාධන අධිකාරි, වැඩිහිටි හා ආබාධිත නිවාස අධිකාරි, සමාජ සේවා නිලධාරි |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | මුල් ගුරු, මුල් ගුරුවරිය, පරිවාස නිලධාරි, නේවාසිකාගාර<br>පාලක, නිවාස පාලක, නිවාස පාලිකා |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය<br>ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | ඉඩම් නිලධාරි/දිස්ත්‍රික් ඉඩම් නිලධාරි (දෙපාර්තමේන්තුමය)<br>ඉඩම් පරිහරණය සැලසුම් නිලධාරි/කච්චේරි මිනින්දෝරු/ජනපද නිලධාරි |
| රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | ග්‍රාම නිලධාරි |
| රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | පර්යේෂණ සහකාර, පරිවර්තක |
| කම්කරු සබඳතා සහ මිනිස් බල අමාත්‍යාංශය | සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) |
| ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය<br>පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | කර්මාන්ත සහකාර, සාමාන්‍යාධිකාරි, කළමනාකරණ සහකාර,<br>ආර්ථික සහකාර, කාර්මික සහකාර |
| සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යාංශය | රෝහල් ලේකම්, සැලසුම් හා වැඩසටහන් නිලධාරි, මහජන සෞඛ්‍ය පරීක්ෂක,<br>ලියාපදිංචි හා සහකාර වෛද්‍ය නිලධාරි |
| පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය<br>පළාත් සභා දෙපාර්තමේන්තුව | සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය),<br>පළාත් පාලන ලිපිකරු නිලධාරි, භාෂා පරිවර්තක, සරප්, ලඝු ලේඛක, යතුරු ලේඛක, ගබඩා භාර නිලධාරි |
| වෙළඳ අලෙවි සංවර්ධන හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය<br>මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව | කිරුම් මිණුම් පරීක්ෂක, මිල පාලන පරීක්ෂක |
| කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | කෘෂිකර්ම උපදේශක<br>ප්‍රාදේශීය නිලධාරි<br>සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) |
| අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය<br>නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රේෂ්ඨාධිකරණය | භාෂා පරිවර්තක, ප්‍රකාශන සහකාර, ලඝු ලේඛක |
| ප්‍රවාහන අමාත්‍යාංශය<br>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | මෝටර් රථ වාහන පරීක්ෂක |

| *දෙපාර්තමේන්තු/අමාත්‍යංශ* | *ශ්‍රේණි* |
|---|---|
| වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව | සැළසුම් සහකාර |
| මධ්‍යම ප්‍රදේශ සංවර්ධන අමාත්‍යාංශය | සංවර්ධන නිලධාරී/ග්‍රාම සංවර්ධන ජ්‍යෙෂ්ඨ අධීක්ෂක/<br>ජ්‍යෙෂ්ඨ ග්‍රාම සංවර්ධන සහකාර/ ග්‍රාම සංවර්ධන<br>නිලධාරී/ග්‍රාම සංවර්ධන සහකාර |
| සංස්කෘතික කටයුතු අමාත්‍යංශය<br>ජාතික කෞතුකාගාරය<br>සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | සංස්කෘතික නිලධාරීන් |
| අධ්‍යාපන අමාත්‍යාංශය | ශිෂ්‍ය නිවාස අධිකාරී |
| තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශය<br>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව<br>රජයේ මුද්‍රණාලය | ප්‍රවෘත්ති නිලධාරී<br>සෝදුපත් කියවන්නා |
| තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය<br>තැපැල් දෙපාර්තමේන්තුව | ටී. 3-5-1 හා ටී 3-4 වැටුප් පරිමාණයේ සිටින ඒකාබද්ධ තැපැල් සේවා නිලධාරීන්,<br>ඒකාබද්ධ තැපැල් සේවයේ තැපැල් සේවා නිලධාරීන් ආ 1 |
| ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය<br>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | ධීවර සහකාර |
| සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් නිලධාරී/සමුපකාර සමිති පරීක්ෂක |
| ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | ආහාර පාලන පරීක්ෂක (කලින් ආහාර හා මිල පරීක්ෂක) |

(ඈ) පළාත් රාජ්‍ය සේවයේ : ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති පහත සඳහන් ඕනෑම සේවයක නිලධාරියෙකු,

ලිපිකරු, ලඝු ලේඛක, යතුරු ලේඛක, සරප්, පොත් තබන්නා, පරිවර්තක, ගබඩා භාරකරු, පුස්තකාලයාධිපති.

(ඉ) පළාත් රාජ්‍ය සේවයේ : ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති පහත සඳහන් ඕනෑම සේවයක නිලධාරියෙකු

ආදායම් පරීක්ෂක, කම්කරු හා සුභසාධන නිලධාරී, කිරුම් මිනුම් පරීක්ෂක, කොළඹ මහ නගර සභාවේ පුණ්‍ය කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සහන නිලධාරී, මාණ්ඩලික නිලධාරී සහ ලේකම්, කළමනාකරණ සේවා නිලධාරී, පළාත් පාලන නිලධාරී

(ඊ) මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් නොවන තනතුරුවලට අයත් නිලධාරීන් විභාගයට අයැදුම් කිරීම නීති විරෝධී වන අතර (තනතුරු නාමයන් වෙනස්වීම හේතුවෙන් නව තනතුරුවලට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන් හැර) ඔවුන් යම් ආකාරයකින් විභාගයට පෙනී සිටියද පත්වීම් සඳහා සලකා බලනු නොලැබේ.

සටහන : (i) 2007.10.05 වැනි දිනට පූර්වාසන්න අවුරුදු 5 තුළ සතුටුදායක සේවා වාර්තාවක් නොමැති නම් විභාගයට පෙනී සිටියද පත්වීම් සඳහා සළකා බලනු නොලැබේ.

(ii) අයැදුම්කරුවෙකු,

(අ) සුදුසුකම් සම්පූර්ණ කළයුතු දිනට පූර්වාසන්න අවුරුදු 05 තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන ඇත්නම් ද, සහ ;

(ආ) මෙම කාලය තුළ කරන ලද වරදකට (අවවාද කිරීම් හැර) කිසියම් දඬුවමක් ලබා නැත්නම් ද, ඔහුට සතුටුදායක සේවාවක් තිබුනේ යැයි සළකනු ලැබේ.

(iii) ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට වැඩ තහනම් කර ඇති නිලධාරියෙකු සුදුස්සෙකු නොවේ.

(iv) ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම පිණිස වන සීමිත තරග විභාගය හා විවෘත තරග විභාගය යන විභාග දෙකම එකට ගත් කල දෙවරකට වඩා ඒවාට පෙනී සිටීමට කිසිවකුට අවසර නැත.

6. *විභාග ගාස්තු*.- විභාගය සඳහා වූ ගාස්තුව රු. 300 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව ඕනෑම දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ආදායම් ශීර්ෂ 4000-20-03-20-13 ට බැර කිරීම සඳහා ගෙවිය යුතුය. දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් අඟල් 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයාගේ අත් අකුරින්ම පිරවිය යුතුය. 1.0 සිට 3.11 දක්වා වන කොටු ඉල්ලුම්පත් කඩදාසියේ පළමු වැනි පැත්තේ ද, 4.0 සිට 8.0 දක්වා කොටු එහි අනිත් පැත්තේ ද වන පරිද්දෙන් තම ඉල්ලුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර එම ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදීම අවශ්‍ය වේ.

(ආ) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂාවෙන්ම ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුය.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2008.09.26 වැනි දින හෝ ඊට කලින් හෝ ලැබෙනු පිණිස බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව (සංවිධාන හා විදේශ විභාග ශාඛාව), විභාග කොමසාරිස් ජනරාල් වෙතට එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිළිව "ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම පිණිස වන සීමිත තරග විභාගය - 2007" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

(ඈ) අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 237,060 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

(ඊ) අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2/3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත්ද, ලියාපදිංචි කළ කුවිතාන්සියද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

8. *විභාගයට ඇතුල්වීම* :

(අ) ඉල්ලුම්පත් එවා ඇති සියලුම පුද්ගලයින්ට විභාග කොමසාරිස් ජනරාල් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ පරිපාලකට තම ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂයෙකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපතිට භාරදිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

සටහන : අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහුට හෝ ඇයට විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සපුරා ඇතැයි යන උපකල්පනය මත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

9. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* : තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම පරිපාලක සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් අනන්‍ය පත්‍රයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පතක් ;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක් ;

10. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම* : අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගයට පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණු සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

12. *විභාග ක්‍රමය* : විභාග මාධ්‍යය

(අ) විභාගය : සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා වලින් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ රජයේ සේවයට ඇතුළත් වීම පිණිස වූ සුදුසුකම් ලබාගැනීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණ සමත් වූ භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විය යුතුය.

සටහන : (i) අපේක්ෂකයෙකු විභාගයේ සෑම ප්‍රශ්න පත්‍රයකට ම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
(ii) ඉල්ලුම්පතෙහි සඳහන් විභාග භාෂාව වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට අවසර දෙනු නොලැබේ.

13. *පරීක්ෂා කිරීමේ ක්‍රමය* :

(අ) පහත සඳහන් විෂයයන් ගැන ලිඛිත පත්‍රවලින් සමන්විත පරීක්ෂණයක්,

| | | |
|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය | - ලකුණු 100 | - කාලය පැය 03 යි. |
| මුදල් රෙගුලාසි | - ලකුණු 100 | - කාලය පැය 03 යි. |
| විෂයානුබද්ධ අධ්‍යයනය | - ලකුණු 100 | - කාලය පැය 02 යි. |

(ආ) වාචික පරීක්ෂණය - ලකුණු 100 කි.

ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතුරෙන් සුදුසුකම් ලැබූවන් වාචික පරීක්ෂණයට කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් වූ අවම ලකුණු ප්‍රමාණය ලබා ගත්තා වූ ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ඉහළ මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූ ද, අපේක්ෂකයන් පමණක් වාචික පරීක්ෂණයට කැඳවනු ඇත. ඉහත සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටිනම්, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන අපේක්ෂකයන් සංඛ්‍යාවක් වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (ලකුණු ලබාදීමේ ක්‍රමය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීමේ මුල් අවස්ථාවේ අනුමත කරනු ලැබේ.)

සටහන : වාචික පරීක්ෂණය සඳහා කැඳවීම පත්වීම් සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සළකනු නොලැබේ. සම්පූර්ණ කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන පරිදි වේ.

එක් වරක දී පත් කරනු ලබන සංඛ්‍යා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් තීරණය කරනු ලැබේ.

14. *විෂයය නිර්දේශය* :

(අ) ***සාමාන්‍ය පරිපාලනය.***- පහත දැක්වෙන පරිච්ඡේද පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ආයතන සංග්‍රහයේ විධිවිධාන, කාර්යාල පරිචාස හා කාර්යාල ක්‍රම සහ තත්කාලීනව භාවිතා වන චක්‍රලේඛ උපදෙස් පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම මෙයින් අපේක්ෂා කෙරේ.

I, II, III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII

(ආ) ***මුදල් රෙගුලාසි.***-

(i) රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - 1 කොටස ('ඉ' පරිච්ඡේදය හැර) ;
(ii) ප්‍රවර්තන වර්ෂයේ ඇස්තමේන්තු - ඒවා පිළියෙල කිරීම ආදායම් ශීර්ෂ, මුදල් හා විසර්ජනය ;
(iii) කච්චේරිවලට අදාළ වන විශේෂිත ගිණුම්වලට අදාළ ආඥා පනත්.

(ඇ) ***විෂයානුබද්ධ අධ්‍යයනය.***- අපේක්ෂකයාගේ නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටළු නිරාකරණය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් කෙරුණු ප්‍රශ්න පත්‍රයකි. මේ සඳහා අපේක්ෂකයා විසින් විසඳුම් ලබා දෙනු පිණිස ප්‍රස්ථාවන් එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධ කරමින් ගොඩනගන ලද ගැටළු ඔහුට යොමු කරනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2008 අගෝස්තු මස වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහායි.)

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2007**

Limited Competitive Examination for Recruitment to the Sri Lanka Administrative Service Grade III - 2007

ඉල්ලුම් පත්‍රය

| 1.0 *මාධ්‍යය :* | 2.0 *නගරය :* |
|---|---|
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4) (අදාළ අංකය කොටුව තුළ ලියන්න.) [ ] | විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය [ ]<br>එම නගර අංකය [ ]<br>(විභාග නිවේදනයේ 1 වන ඡේදයට අනුව නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.) |

3.0 *පෞද්ගලික තොරතුරු :*

3.1 මුල'කුරු අගට යොදා මුල'කුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

| උදාහරණ : SILVA, A. B. |
|---|

3.2 සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.4 කාර්යාලීය ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

3.5 කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.6 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.7 ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - 0, ස්ත්‍රී - 1) (අදාළ අංකය කොටුව තුළ ලියන්න) [ ]

3.8 විවාහක/අවිවාහක බව : (අවිවාහක - 1, විවාහක - 2) (අදාළ අංකය කොටුව තුළ ලියන්න) [ ]

3.9 ජන වර්ගය : (සිංහල -1, දෙමළ - 2, ඉ. දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5) (අදාළ අංකය කොටුව තුළ ලියන්න) [ ]

3.10 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

3.11 උපන් දිනය : වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

4.0 ඔබ සේවයට/ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/වාචික පරීක්ෂණය සමත් වූ භාෂාව සඳහන් කරන්න. :————.

5.0 (i) ගැසට් නිවේදනයේ 5 වන ඡේදයේ සඳහන් සේවා දෙපාර්තමේන්තු ශ්‍රේණි වලින් ඔබේ සේවාව/ශ්‍රේණිය (පන්තියක්, ශ්‍රේණියක් හෝ ඛණ්ඩයක් (ඇත්නම්) එය සඳහන් කළ යුතුය. :————.

(සුදුසුකම් ලබාදෙන සේවා/ශ්‍රේණි එකකට වැඩි ගණනක ඔබ සේවය කර ඇත්නම්, එම සේවාවන් හා ශ්‍රේණීන් දිනයන් සහිතව සඳහන් කළ යුතුය.)

(අ) දැනට දරන තනතුර :—————.
තනතුර අයත් සේවය :—————. (රාජ්‍ය සේවය/පළාත් රාජ්‍ය සේවය)
ශ්‍රේණිය :—————.
පන්තිය/ඛණ්ඩය :—————.
තනතුරට පත් වූ දිනය :—————.
එම තනතුරේ ස්ථිර කළ දිනය :—————.
උපාධිය ලැබූ දිනය :—————.

(ආ) සුදුසුකම් ලබාදෙන අනෙකුත් සේවාවන්/ශ්‍රේණීන් (ඇත්නම්)

| *සේවය/ශ්‍රේණිය නම* | *පත් වූ දිනය* | *ස්ථිර කළ දිනය* | *සේවා කාලය*<br>*දින ... සිට ... දක්වා* |
|---|---|---|---|
| (1) ........................ | ........................ | ........................ | ........................ |
| (2) ........................ | ........................ | ........................ | ........................ |
| (3) ........................ | ........................ | ........................ | ........................ |
| (4) ........................ | ........................ | ........................ | ........................ |
| (5) ........................ | ........................ | ........................ | ........................ |

(ii) ගැසට් නිවේදනයේ 5 වැනි ඡේදයේ සඳහන් කර ඇති සේවාවන්/ශ්‍රේණිවල 2007.10.05 වැනි දිනට ස්ථිර සහ අඛණ්ඩ මුළු සේවා කාලය :—————.

6.0 (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගයට පෙනී සිටි වර්ෂ :

(i) —————.
(ii) —————.
(iii) —————.
(iv) —————.
(v) —————.
(vi) —————.

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගයට පෙනී සිටි වර්ෂ :

(i) —————.
(ii) —————.
(iii) —————.

7.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න.

(ලදුපත නොගැළවෙනසේ මෙහි අලවන්න.
ඡායා පිටපතක් ළඟ තබා ගන්න.)

8.0 *අයදුම්කරුගේ සහතිකය :*

.............. දිනට පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත්, (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි.

සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ............ හා ............ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

9.0 *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* : (පෞද්ගලික ලිපිගොනුවට අනුව)

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ...................... මයා/මිය/මෙනවිය ...................... වැනි දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාලසීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධික හැර) ඔහුගේ/ඇයගේ වේතානාධික සියල්ලම උපයාගෙන ඇති බව ද, එම කාලසීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බව ද, මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු, වාර්තා ආශ්‍රයෙන් නිවැරදි යයි සොයාගෙන ඇති බව ද, අදාළ ගැසට් නිවේදනයන්හි සඳහන් රෙගුලාසි ප්‍රකාර ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී, මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ බව ද, මෙයින් සහතික කරමි.

—————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/
බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :—————.
පදවි නාමය :—————.
දිනය :—————.

(නිල මුද්‍රාව යොදන්න)

08-936

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ජාතික හා පළාත් පාසල්වල පවතින පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයට මෞලවි ගුරුවරුන් බඳවා ගැනීමේ තරග විභාගය - 2008/2009

දිවයිනේ ජාතික හා පළාත් පාසැල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු සඳහා ගුරු සේවා ව්‍යවස්ථා ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-II වන ශ්‍රේණියට මෞලවි ගුරුවරුන් බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ.

(1) *යෝග්‍යතා* :-

1:1 *සාමාන්‍ය සුදුසුකම්* :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
ii. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
iii. 2008.09.30 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

1:2 *තරග විභාගයට පෙනී සිටීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්* :

1.2.1 ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2008.09.30 දිනට අ.පො.ස. (සා.පෙ) දෙවරකට නොවැඩි වාර ගණනක දී මව්බස, ගණිතය හා අරාබි විෂයයන් සමත්ව, සම්මාන 03 ක් සහිතව විෂයයන් 06 කින් සමත් වී තිබීම.

1.2.2 අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් ඕනෑම විෂයයන් (03) තුනක් එකවර සමත් වී තිබීම.

1.2.3.1 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අල් ආලිම් විභාගයේ අවසාන පරීක්ෂණය සමත් වී තිබීම;

හෝ

1.2.3.2 මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මගින් පිළිගත් ආරාබි විද්‍යාලකින් අවුරුදු 07 ක පාඨමාලාවක් හදාරමින් ලබාගත් මෞලවි සහතිකයක් තිබීම.

ගුරු වෘත්තියට පිවිසෙන සෑම කෙනෙකුම ඉහත කොන්දේසි සපුරා තිබිය යුතුය.

(02) *බඳවා ගැනීමේ ක්‍රමය සහ සේවා කොන්දේසි* :-

2.1 සුදුස්සන් තෝරා ගැනීම සඳහා, ඉදිරිපත් වන අයදුම්කරුවන් අතරින් රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීම්වලට අදාළව ජාතික හා පළාත් පාසල් සඳහා ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉදිරියේදී පවත්වනු ලබන ගුරුවරුන් බඳවා ගැනීමේ තරග විභාගයේ දී ලබාගන්නා ලකුණුවල ප්‍රමුඛතාව අනුව සම්මුඛ පරීක්ෂණයක් මගින්

බඳවා ගනු ලැබේ. කෙසේ වෙනත් ප්‍රමුඛතාව සළකා බැලීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40% ක් හෝ ලබාගත යුතුය. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදීමක් සිදු නො කෙරේ.

2.2 පළාත් පාසැල් සඳහා අයදුම් කරන අයදුම්කරුවන් අවම වශයෙන් වසර 05 ක වත් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

2.3 සිංහල හා දෙමළ භාෂාවෙන් පමණක් විභාගය පවත්වනු ලැබේ.

2.4 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලැබේ.

2.5 රජයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලට යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-11 වන ශ්‍රේණියට පත් කරනු ලැබේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (iv) හි T -S- 1-2006 (A) වැටුප් ඛණ්ඩයේ රු. 13,120 - 10 x 145-5 x 180 - රු. 15,470ක මාසික වැටුප් ක්‍රමය යටතේ වැටුප් ගෙවනු ලැබේ.

2.6 මෙම පත්වීම් ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

2.7 උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදු කරනු ඇත.

(03) *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-*

3.1 ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපිටම භාවිතා කරමින් මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 04 තෙක් පළමුවන පිටුවට ද 05 සිට 08 තෙක් දෙවන පිටුවට ද වන ලෙස අයදුම්පත් සකස් කර ගත යුතු අතර ඊට අදාල තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතු වේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

3.2 අයදුම්පත්‍රය සම්පූර්ණ කරනවිට ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය හා දිස්ත්‍රික් අංකය පහත දැක්වෙන වගුවල සඳහන් ආකාරයට යොදන්න. මෙම තොරතුරුවලට පරිබාහිර තොරතුරු යොදාගත් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| *අංකය* | *දිස්ත්‍රික්කය* |
|---|---|
| 01 | කොළඹ |
| 02 | ගම්පහ |
| 03 | කළුතර |
| 04 | මහනුවර |
| 05 | මාතලේ |
| 06 | නුවරඑළිය |
| 07 | ගාල්ල |
| 08 | මාතර |
| 09 | හම්බන්තොට |
| 10 | යාපනය |
| 11 | මන්නාරම |
| 12 | වව්නියාව |
| 13 | මුලතිව් |
| 14 | කිලිනොච්චිය |
| 15 | මඩකලපුව |
| 16 | අම්පාර |
| 17 | ත්‍රිකුණාමලය |
| 18 | කුරුණෑගල |
| 19 | පුත්තලම |
| 20 | අනුරාධපුරය |
| 21 | පොළොන්නරුව |
| 22 | බදුල්ල |
| 23 | මොණරාගල |
| 24 | රත්නපුර |
| 25 | කෑගල්ල |

3.3 අදාළ ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඔබ ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

3.4 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2008.09.30 දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල, යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

3.5 තැපෑලේදී නැතිවන හෝ ප්‍රමාදවන හෝ අයදුම්පත්‍ර ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

3.6 අධ්‍යාපන අමාත්‍යංශය වෙත හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව/ කලාප අධ්‍යාපන කාර්යාල වෙත හෝ නිලධාරීන්ගේ පුද්ගලික නම්වලට හෝ එවනු ලබන අයදුම්පත්‍ර කිසිවක් සලකා බලනු නොලැබේ.

3.7 අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ "ජාතික හා පළාත් පාසල් සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයට මෞලවි ගුරුවරුන් බඳවා ගැනීම 2008/2009" යනුවෙන් පැහැදිලිව පෙනෙන සේ සඳහන් කළ යුතුය. පළාත් පාසැල් සඳහා ඉල්ලුම් කරන්නේ නම් එම අදාළ දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

04. *විභාග මධ්‍යස්ථාන* :-

4.1 ලිඛිත පරීක්ෂණය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පහත දැක්වෙන නගරවල පමණක් පවත්වනු ලැබේ. අදාළ විභාගය පවත්වන දිනය හා ස්ථානය විභාග කොමසාරිස් ජනරාල් විසින් පසුව දැනුම් දෙනු ඇත.

| *විභාගය පැවැත්වෙන නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 1 |
| මාතර | 2 |
| කල්මුනේ | 3 |
| මහනුවර | 4 |

4.2 අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද සහිතව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(05) *විභාග නිවේදනය*.—විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කර විභාගයට පෙනී සිටිය යුතුය. විභාග ප්‍රවේශපත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවස්ථාවක් දෙනු නොලැබේ.

(06) *විභාග ගාස්තු*.—විභාග ගාස්තුව රු. 300 කි. ශීර්ෂ අංක 4000- 20 -03 -20-13 යටතේ විභාග කොමසාරිස් ජනරාල් නමින්, ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත (රිසිට්පත්‍රය) ඉල්ලුම්පත්‍රයේ නියමිත තීරුවේ අලවා එම ලදුපත් අංකය සඳහන් කරන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(07) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය හෝ පමණි.

(08) අපේක්ෂකයෙකු සඳහා විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බව පිළිගැනීමක් ලෙස නොසැලකේ.

(09) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(10) *විභාග පරිපාටිය*.—විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. ප්‍රශ්න පත්‍ර දෙකම බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලින් යුක්තය.

1. අභියෝග්‍යතා පරීක්ෂණය (01) කාලය පැය 01 යි (ලකුණු 100 යි).
අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.

2. සාමාන්‍ය දැනීම — (02) — කාලය පැය 01 යි (ලකුණු 100 යි)
ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සංස්කෘතික සහ ආගමික, සමාජයීය, විද්‍යාත්මක හා ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය හා විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

11. *තෝරා ගැනීමේ ක්‍රමය :*

1. පළාත් පාසල් සඳහා ඒ ඒ දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු වෙනුවෙන් අයදුම් කරන ලද, එම දිස්ත්‍රික්කවල පදිංචි අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ දී වැඩිම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් 410 දෙනෙකු අදියර දෙකක් යටතේ තෝරාගනු ලැබේ.

2. ජාතික පාසල් සඳහා ඒ ඒ දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු වෙනුවෙන් අයදුම්කරන ලද, එම දිස්ත්‍රික්කවල පදිංචි අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් 14 දෙනෙකු අදියර දෙකක් යටතේ තෝරාගනු ලැබේ.

**ජාතික හා පළාත් පාසල් සඳහා අදියර දෙකක් යටතේ මෞලවි ගුරුවරුන් බඳවාගනු ලබන සංඛ්‍යාවන් පහතින් දක්වා ඇත**

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *2008* | | *2009* | | | *ජාතික පාසල්* | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | *2008* | | *2009* | |
| | | *දෙමළ මාධ්‍ය* | *සිංහල මාධ්‍ය* | *දෙමළ මාධ්‍ය* | *සිංහල මාධ්‍ය* | | *දෙ.මා.* | *සි. මා.* | *දෙ. මා.* | *සි. මා.* |
| බස්නාහිර | කොළඹ | 03 | 03 | 03 | 03 | 12 | | 01 | | 01 |
| | ගම්පහ | 03 | | 03 | | 06 | | | | |
| | කළුතර | 03 | 02 | 03 | 02 | 10 | | | | |
| | | 09 | 05 | 09 | 05 | **28** | | | | |
| දකුණ | ගාල්ල | 03 | 02 | 03 | | 08 | 01 | | | 01 |
| | මාතර | 04 | | 04 | 01 | 09 | | | | |
| | හම්බන්තොට | 03 | | 03 | 01 | 07 | | | | |
| | | 10 | 02 | 10 | 02 | **24** | | | | |
| මධ්‍යම | මහනුවර | 17 | 02 | 17 | 02 | 38 | 01 | | | |
| | මාතලේ | 07 | | 07 | | 14 | | | 01 | |
| | නුවරඑළිය | 01 | | 01 | | 02 | | | | |
| | | 25 | 02 | 25 | 02 | **54** | | | | |
| නැගෙනහිර | අම්පාර | 30 | | 30 | | 60 | 01 | | 01 | |
| | මඩකලපුව | 15 | | 15 | | 30 | 01 | | | |
| | ත්‍රිකුණාමලය | 20 | | 20 | | 40 | | | 01 | |
| | | 65 | | 65 | | **130** | | | | |
| වයඹ | කුරුණෑගල | 24 | 01 | 24 | 01 | 50 | 01 | 01 | 01 | |
| | පුත්තලම | 13 | | 13 | | 26 | | | 01 | |
| | | 37 | 01 | 37 | 01 | **76** | | | | |
| උතුරුමැද | අනුරාධපුර | 18 | | 18 | | 36 | | | | |
| | පොළොන්නරුව | 04 | | 04 | | 08 | | | | |
| | | 22 | | 22 | | **44** | | | | |
| සබරගමුව | කෑගල්ල | 11 | 01 | 11 | | 23 | | | | |
| | රත්නපුර | 03 | | 03 | 01 | 07 | | | | |
| | | 14 | 01 | 14 | 01 | **30** | | | | |
| ඌව | බදුල්ල | 04 | | 04 | | 08 | | | | |
| | මොණරාගල | 02 | | 02 | | 04 | | | | |
| | | 06 | | 06 | | **12** | | | | |
| උතුර | වව්නියාව | 03 | | 04 | | 07 | | | | |
| | මන්නාරම | 02 | | 02 | | 04 | | | | |
| | යාපනය | 01 | | | | 01 | | | | |
| | | 06 | | 06 | | **12** | | | | |
| එකතුව | | **194** | **11** | **194** | **11** | **410** | **05** | **02** | **05** | **02** |
| මුළු එකතුව | | | | **424** | | | | | | |

12. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් :

12.1 කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා අදාල කොටුව විභාග දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව සඳහා හිස්ව තබන්න.

12.2 ඉල්ලුම් කරනු ලබන දිස්ත්‍රික්කය කිසිසේත් වෙනස් කරනු නොලබන අතර ඒ පිළිබඳව ඉදිරිපත් කරන අභියාචනා පිළිබඳව සැලකිලිමත් නොවේ. එසේම එක් අපේක්ෂකයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

12. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින් ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය ද රේඛීය අමාත්‍යාංශයේ ලේකම් සතුය.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා [ ]

ජාතික හා පළාත් පාසල්වල පවතින පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයට මෞලවි ගුරුවරුන් බඳවා ගැනීමේ තරග විභාගය - 2008/2009

Competitive Examination for recruitment of Moulavi Teachers to the Sri Lanka Teachers' Service for the vacancies existing in National and Provincial Schools - 2008/2009

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]
සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විභාගයට පෙනී සිටින නගරය හා නගර අංකය — නගරය [ ] — නගර අංකය [ ]

(නගරය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න. නගර අංකය නිවේදනයේ 4.1 හි දක්වා ඇත.)

| පදිංචි දිස්ත්‍රික්කය (නිවේදනයේ 2.2 බලන්න) | | අංකය | |
|---|---|---|---|

(නිවේදනයේ 3.2 යටතේ ඇති වගුවට අනුව සම්පූර්ණ කරන්න)

01. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා.- NAZEER A. B. :————.

1.2 මුලකුරුවලින් දැක්වෙන නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

02. 2.1 වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):————.
. (ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය පුරුෂ - 0 ස්ත්‍රී -1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න): [ ]

3.2 විවාහක/අවිවාහක බව අවිවාහක -1 විවාහක - 2 : [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

04. අයදුම්කරනු ලබන පාසල් වර්ගය :————. [ ]
ජාතික පාසල් - 1
පළාත් සභා පාසල් - 2
ජාතික හා පළාත් සභා දෙකටම - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. 5.1 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

5.2 2008.09.30 දිනට වයස අවු. [ | ] මාස [ | ] දින [ | ]

06. 6.1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් (අකුරින්) :————.

6.2 කුවිතාන්සියේ අංකය :————.

6.3 නිකුත් කළ කාර්යාලය :————.

6.4 දිනය :————.

| කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න. මුදල් කුවිතාන්සිය නොගැලවෙනසේ මෙහි අලවන්න. |
|---|

07. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ ප්‍රකාශය ඃ

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත්වන බව මම දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

08. (දැනටමත් සේවයේ යෙදී සිටින අය සඳහා පමණි)
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ඃ

........................... මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන බවත්.............. දිනට පූර්වාසන්න පස් අවුරුදු කාල සීමාව තුළ අවවාද කිරීම හැර/කිසිදු දඬුවමකට ලක් වී නැති බවත්, ඇමුණුම් යටතේ සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, අදාළ තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් වහාම මුදාහල හැකි බවත් සහතික කරමි.

————.
ප්‍රධානියාගේ අත්සන හා පදවිය.

දිනය :————.

08-1103

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1/2-1/2-11 හා 3 වන පන්තිවල නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය — 2008

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1, 2-1, 2-11 හා 3 වැනි පන්තිවල නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2008 දෙසැම්බර් මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම විභාගවලට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1086/26 දරන 1999.07.02 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය සහ අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත. (වයස අවුරුදු 45 ඉක්මවූ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස්වීමට හැකිවන අයුරින් ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවේ 27 වන ඡේදයේ ඇ වගන්තියෙන් සලසා තිබූ විධිවිධානයක් 2001.09.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 20/2001 අංක දරන චක්‍රලේඛයෙන් අහෝසි කර ඇති බැවින්, විදුහල්පති සේවයට අයත් සියලුම නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් විය යුතු වේ.)

(අ) විභාග පරිපාටිය - කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයයන් පහත දැක්වේ. ඃ

*විෂය අංක 01 - ආයතන සංග්‍රහයේ විධිවිධාන :—*

1 වන කොටස - බහුවරණ ප්‍රශ්න 50 යි - කාලය පැය 01 යි
ලකුණු 50 යි

2 වන කොටස - ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි - කාලය පැය 01 යි
ලකුණු 50 යි

විෂය අංක 02 - පාසල්වල මූල්‍ය පරිපාලනය -

1 වන කොටස - බහුවරණ ප්‍රශ්න 50 යි - කාලය පැය 01 යි
ලකුණු 50 යි
2 වන කොටස - ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි - කාලය පැය 01 යි
ලකුණු 50 යි

විෂය අංක 03 - අධ්‍යාපන පරිපාලනය හා අධීක්ෂණය -

1 වන කොටස - බහුවරණ ප්‍රශ්න 50 යි - කාලය පැය 01 යි
ලකුණු 50 යි
2 වන කොටස - ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි - කාලය පැය 02 යි
ලකුණු 50 යි

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ඇතුළුව අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල සහ ආයතනවල සංවිධානය සහ කාර්යයන් පාසල් පරිපාලනය, පාසල් හා සමාජය අතර සම්බන්ධතා, පාසල් අධීක්ෂණය සහ ගුරුවරුන්ගේ කාර්යය සාධනය ඇගයීම සහ ජාතික, ප්‍රාදේශීය හා පාසල් මට්ටමේ අධ්‍යාපන සැළසුම්කරණය

03. සාමාර්ථයන් ලැබීම සඳහා අපේක්ෂකයකු ඉල්ලුම් කරන එක් එක් විෂයකට අවම වශයෙන් 40% ක හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

04. විභාගයේ භාෂා මාධ්‍යය - සිංහල/දෙමළ/ඉංග්‍රීසි (ඉල්ලුම් කරන මාධ්‍ය වෙනස් කරනු නොලැබේ.)

(i) අපේක්ෂකයෙකුට රාජ්‍ය භාෂාවෙන් පිළිතුරු ලිවිය හැක.

හෝ

(ii) අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුළුවීම සඳහා පෙනී සිටි තරග විභාගයේ භාෂා මාධ්‍ය හෝ තරග විභාගයක් නොමැතිව රාජ්‍ය සේවයට බැඳුනු අය සම්බන්ධයෙන් ඔවුන් රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය හැක.

05. යම්කිසි අපේක්ෂකයෙකු තමන්ට හිමිකමක් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

06. පහත දැක්වෙන ආකෘතියට අනුව 01 සිට 06 තෙක් ශීර්ෂ ඒ-4 ප්‍රමාණයේ කඩදාසියක පළමු වන පිටුවේ ද, ඉතිරි ශීර්ෂ දෙවන පිටුවේ ද වන ලෙස සකස් කළ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු බවත් ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රයක්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍රයක්, දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව හා එම ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තව ද, අසම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත් එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරන බවත් වැඩි දුරටත් සඳහන් කරමි. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීමට අවශ්‍ය බව දන්වමි.

07. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීති රීති මෙම නිවේදනය අවසානයේ පළකොට ඇත.

08. ඉල්ලුම්පත් 2008 සැප්තැම්බර් 26 වැනි දින හෝ ඊට ප්‍රථම බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි විදුහල්පති/කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ/කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මඟින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. මෙදිනට පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. යම්කිසි අපේක්ෂකයෙකුට යටත් පිරිසෙයින් විභාගයට දින 07 ක් කලින් තමාගේ ප්‍රවේශපත්‍රය නොලැබුණහොත්, ඔහු ඒ බව අප්‍රමාදව බත්තරමුල්ල, පැලවත්ත විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්ට දැනුම් දිය යුතුය. (විදුලි පණිවුඩ යවන ලිපිනය "විභාග" පැලවත්ත, බත්තරමුල්ල වේ) ප්‍රවේශපත්‍රය නොලැබුනු බව විභාග කොමසාරිස් ජනරාල්ට දැනුම් දෙන විට පහත දැක්වෙන තොරතුරු ද සැපයිය යුතුය. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත :

(i) විභාගයේ නම ;
(ii) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම ;
(iii) අපේක්ෂකයාගේ සම්පූර්ණ ලිපිනය ;
(iv) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ දිනය, ලියාපදිංචි කළ අංකය හා තැපැල් කන්තෝරුව.
(v) නුදුරුව සිටින අයට පණිවුඩකරුවකු මඟින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දෙන ලෙස උපදෙස් දෙනු ලැබේ.

10. ඉහත 08 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සළකා බලනු නොලැබේ.

11. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වේ. ඒ සඳහා-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

12. විභාග ගාස්තු ඃ

(අ) මෙම විභාගය සඳහා අය කරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

(ආ) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේ දී ගාස්තු අය කරනු නොලැබේ.

(ඇ) ඊට පසු එක් එක් වතාව සඳහා අය කෙරෙන ගාස්තු පහත දැක්වේ ;

සම්පූර්ණ විභාගය සඳහා රු. 120

එක් විෂයයක් සඳහා රු. 40

විභාගය සඳහා ආදායම් මුද්දර මගින් ගෙවිය යුතුය. මෙම මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා අපේක්ෂකයාගේ අත්සන තැබීමෙන් නිසි පරිදි අවලංගු කළ යුතුය.

13. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කලහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් විමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2008 අගෝස්තු මස 08 වැනි දින,
පැලවත්ත, ඉසුරුපායේ අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

*ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1/2 - 1/2-11/3 පන්තිවල නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය*

Efficiency Bar Examination for officers in Class 1/2-1/2-II/3 in Sri Lanka Principals' Service

(විදුහල්පති/කොට්ඨාස/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කිරීම සඳහා විභාගයේ නම කවරයේ වමත්පස ඉහළ සඳහන් කළ යුතුය.)

| | |
|---|---|
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |

සිංහල-2/ දෙමළ - 3/ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(මුල් අකුරු සමග ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදා. SILVA H. A.)

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. උපන් දිනය : වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

03. (i) විදුහල්පති සේවයේ පන්තිය/ශ්‍රේණිය :————.
(ii) පාසල/කාර්යාලය :————.
(iii) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව/කළාප අධ්‍යාපන කාර්යාලය :————.

04. ලිපිනය :
(i) පෞද්ගලික :————.
(ii) රාජකාරි :————.
(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

05. ජාතික හැඳුනුම්පත් අංකය [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

06. ගැසට් නිවේදනයේ 02 වැනි ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය සහිතව අයදුම් කරනු ලබන විෂයයන් :

| | |
|---|---|
| විෂය අංකය 01 - ආයතන සංග්‍රහයේ විධිවිධාන | |
| විෂය අංකය 02 - පාසල්වල මූල්‍ය පරිපාලනය | |
| විෂය අංකය 03 - අධ්‍යාපන පරිපාලනය හා අධීක්ෂණය | |

(අදාල විෂය අංකය/අංක කොටුව/කොටු තුළ ලියන්න)

07. මීට ප්‍රථම මෙම විභාගයට සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් හෝ පෙනී සිට තිබේදැයි සඳහන් කරන්න. එසේ නම් විෂය ද විෂය අංකය ද වසර සහ මාධ්‍ය ද සඳහන් කරන්න.

| *විෂය* | *විෂය අංකය* | *වසර* | *මාධ්‍යය* |
|---|---|---|---|
| | | | |

08. ගෙවන ලද විභාග ගාස්තු :

| මුද්දර මෙහි අලවන්න |
|---|

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

**විභාග කොමසාරිස් ජනරාල්**

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයා මගේ පාසලේ/කාර්යාලයේ නිලධාරියෙකු බව මම සහතික කරමි. තව ද, අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන මුද්දරය නිසි පරිදි අවලංගු කර ඇති බව ද සහතික කරමි.

————,
විදුහල්පති/කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන
අධ්‍යක්ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන.
(විදුහල්පත්වරයෙකු නම් පාසලේ නම සඳහන් කරන්න).

ලිපිනය :————.

දිනය :————.
(අදාළ නොවන වචන කපා හරින්න)

08-846

## මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය ක්‍රියාත්මකව පවත්නා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල ක්‍රමසම්පාදන කටයුතුවල නිරත නිලධාරීන් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II වැනි පංතියේ II වැනි ශ්‍රේණියට (අධිසේවක පදනම මත) පත් කිරීම සලකා බැලීම සඳහා අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II වැනි පංතියේ II වැනි ශ්‍රේණියට (අධිසේවක) පත් කිරීම සලකා බැලීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී 2008 නොවැම්බර් මාසයේ දී පවත්වනු ලබන විභාගය සඳහා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය ක්‍රියාත්මකව පවත්නා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල ක්‍රමසම්පාදන කටයුතුවල නිරත පහත සඳහන් නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂමේ නියමය පරිදි මෙයින් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

*02. අවශ්‍ය සුදුසුකම් :*

2000.05.30 දිනට බල පැවැත්වෙන ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථාවේ "ඉ" පරිශිෂ්ටයේ සඳහන් පහත වැටුප් පරිමාණයන් සහිත (රා. ප. ච. 6/2006) සේවාවල නිලධාරීන්ට පමණක් ඉල්ලුම් කල හැක.

(අ) සැලසුම් ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්
එම්එන්-5 රු. 15,785-10x290-15x325-11x400-රු. 27,960

(ආ) සංවර්ධන නිලධාරීන්
එම්එන්-4 රු. 14,850-10x185-4x210-15x290-7x320-රු. 24,130

(ඇ) සංඛ්‍යා ලේඛණ සහකාරවරුන් (මුදල් හා ක්‍රමසම්පාදන විෂයභාර අමාත්‍යාංශය)
එම්එන්-4 රු. 14,850-10x185-4x210-15x290-7x320-රු. 24,130

(ඈ) ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන් - (යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය)
එම්එන්-5 රු. 15,785-10x290-15x325-11x400-රු. 27,960

(ඉ) ව්‍යාපෘති නිලධාරීන් (සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය)
එම්එන්-5 රු. 15,785-10x290-15x325-11x400-රු. 27,960

(ඊ) සංවර්ධන සහකාර (සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය) (දැනට සංවර්ධන නිලධාරී)
එම්එන් -4 රු. 14,850-10x185x4x210-15x290-7x320-රු. 24,130

*අවශ්‍ය සුදුසුකම් :*

(i) 2007 ජනවාරි 01 දිනට ඉහත දැක්වෙන තනතුරක අවුරුදු 5කට නොඅඩු අඛණ්ඩ හා සතුටුදායක ස්ථිර සේවා කාලයක් තිබීම;

(ii) ඉහත තනතුරක පත්වීම ස්ථිර කර තිබීම;

(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම;

(iv) පහත සඳහන් ලියකියවිලි නියම කළ විටෙක ඉදිරිපත් කිරීමට අපේක්ෂකයා සූදානම් වී සිටිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය;

(ආ) උපාධි හෝ පශ්චාත් උපාධි සහතිකය හෝ සහතික (සුදුසුකම් ලත් සහතිකය);

(ඇ) සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාගයේ සහතිකය.

*සැ. යු.* —ඉල්ලුම් පත්‍රය සමග මෙම කිසිදු ලියවිල්ලක් හෝ පිටපතක් හෝ (විභාග ගාස්තු ගෙවීමේ කුවිතාන්සිය හැර) නොඇමිණිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් සහ සේවා කොන්දේසි :*

ක්‍රමසම්පාදන සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට අධිසේවක පදනම මත විභාගයේ ප්‍රතිඵල අනුව ලකුණු 40කට වඩා ලබාගත් අයහට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්වීම් දෙනු ලැබේ. අධිසේවක සංඛ්‍යා පදනම සම්බන්ධ වූ කොන්දේසි පහත දැක්වේ.—

(i) මෙම තනතුර ස්ථිරය විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය;

(ii) උපලේඛනගත තනතුරුවලට ලබා දී ඇති වරප්‍රසාද වැනි දෑ නොමැතිව ගෙවනු ලබන වැටුපෙන් පමණක් ඔවුන් සෑහීමකට පත්විය යුතුය;

(iii) ක්‍රම සම්පාදන සේවයේ සියලුම නිලධාරීන් පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය. මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ.

(අ) ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන, මූල්‍ය සහ පරිපාලනය,

(ආ) ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය,

(ඇ) ව්‍යාපෘති සැලසුම් කිරීම,

(ඈ) ඉංග්‍රීසි භාෂාව.

(මේ පිළිබඳ සම්පූර්ණ විස්තර 2000.05.30 වැනි දිනැති අංක 1134/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථාවේ 'ඈ' පරිශිෂ්ඨයේ දක්වා ඇත.)

(iv) ස්ථිර තනතුරක් දැරීම සඳහා සුදුසුකම් ලැබීමට නම් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව කෙරෙන උසස්වීම්/බඳවාගැනීම් විභාගයන්ට මුහුණ දී සමත්විය යුතුය;

(v) තමන්ටම පෞද්ගලිකවනසේ අධිසේවක පදනම මත අදාල තනතුර දැරිය යුතුය;

(vi) මෙම ආකාරයට ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථාවේ "ඉ" පරිශිෂ්ටයේ සඳහන් නිලධාරීන්ට පත්වීම ලබාදුන් පසු එම ඇබෑර්තු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථාවේ "ඉ" පරිශිෂ්ටයේ අදාල සේවාවන්ගෙන් ඉවත් කරනු ලැබේ.

04. *ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය :* (රා. ප. ච. අංක 6/2006 අනුව).—

මාසික වැටුප් පරිමාණය— රු. 22,935-10x645-8x790-17x1050-රු. 53,555 (මාසික වැටුප රු. 24,225ට පෙර 1 වැනි කාර්යක්ෂමතා කඩඉම සහ රු. 28,095ට පෙර 2 වැනි කාර්යක්ෂමතා කඩඉම)

I පංතිය ආරම්භක මාසික වැටුප රු. 36,755

II පංතිය ආරම්භක මාසික වැටුප (ශ්‍රී ලං. ක්‍ර. සේ. II පංතිය I ශ්‍රේණිය) රු. 30,175

III පංතිය ආරම්භක මාසික වැටුප (ශ්‍රී. ලං. ක්‍ර. සේ. II පංතිය : II ශ්‍රේණිය II) - රු. 22,935

05. ඉල්ලුම් පත්‍ර හා විභාග ගාස්තු *:*

(අ) මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු. 300 කි. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට ප්‍රථම ආදායම් ශීර්ෂ 4000-20-03-20-13ට බැර වන සේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සිය ඉල්ලුම් පත්‍රයේ දෙවැනි පිටුවේ උඩ තීරයේ ඇලවිය යුතුය. (මෙම විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.) නියමිත දිනට පසුව විභාග ගාස්තු ගෙවන ලද ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

මුදල් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ ලඟ සුරැකිව තබාගන්න.

(ආ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනවාත් සමඟ විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග දිනය දන්වමින් පුවත්පත් නිවේදනයක් නිකුත් කරනු ලැබේ. විභාගයට නියමිත දිනට දින 07කට වත් පෙර ප්‍රවේශ පත්‍ර නොලද අපේක්ෂකයන්, පැලවත්ත, බත්තරමුල්ල ලිපිනයට විභාග කොමසාරිස් ජනරාල්ට පහත විස්තර දැනුම් දිය යුතුය :-

(i) විභාගයේ නම;

(ii) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම;

(iii) ලිපිනය;

(iv) ඉල්ලුම්පත තැපැල් කළ දිනය, තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය;

(v) මුදල් ගෙවූ දිනය, ස්ථානය හා කුවිතාන්සි අංකය.

*06. විභාගයට ඇතුළත් වීම :*

අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුයි. විභාගයට පෙනී සිටින දිනයේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. විභාගය කොළඹ දී පැවැත්වෙන අතර, විභාගයට පැමිණීම වෙනුවෙන් ගමන් ගාස්තු, උපවේශණ දීමනා හිමි නැත.

*සටහන.*—අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

*07. අයදුම් කළයුතු පිළිවෙල :*

(අ) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රය අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ඉල්ලුම්පත්‍ර සකස් කර ගත යුතුය. 01 සිට 08 දක්වා කොටස් 1 වැනි පිටුවට ඇතුළත් වන පරිදි අයදුම් පත්‍රය සකස් කළ යුතුය.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2008.09.26 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ බත්තරමුල්ල, පැලවත්ත, විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවර ''ක්‍රමසම්පාදන සේවයට (අධිසේවක පදනම මත) බඳවාගැනීමේ සීමිත තරග විභාගය'' යන්න පැහැදිලිව ලිවිය යුතුය.

(ඇ) නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර තම ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් නියමිත දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

(ඈ) අයදුම් පත්‍රය සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ය.

(ඉ) අදාළ ආකෘතියට අනුකූල නොවන, අසම්පූර්ණ එමෙන්ම ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර කිසිම දැනුම් දීමක් නොමැතිව ප්‍රතික්ෂේප කරනු ඇත. ඉල්ලුම්පත්‍ර තැපෑලේ දී නැතිවීම නිසා හා ප්‍රමාදවීම පිළිබඳ කෙරෙන පැමිණිලි සලකා බලනු නොලැබේ.

08. *අපේක්ෂකයාගේ අනන්‍යතාව :*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගැනේ :-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද අනන්‍යතා පත්‍රය,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය (විභාග දිනට අවුරුදු තුනකට කලින් නිකුත් නොකරන ලද).

09. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයට පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ ප්‍රකාශිත විභාග අපේක්ෂකයන් සඳහා වූ නීති හා උපදෙස් ද පිළිපැදිය යුතුය.

10. *මාධ්‍යය :*

මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

(අ) අපේක්ෂකයෙක් කැමැති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය.

(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුත්තේ එක් භාෂාවකින් පමණි.

(ඇ) විභාගයේ දී මාධ්‍යය වෙනස් කිරීමට අවසර නොලැබේ.

11. *විභාග ක්‍රමය :*

(අ) "ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා ව්‍යාපෘති ඇගයීම" යන පැය 2ක ප්‍රශ්න පත්‍රයකි.- ලකුණු 100යි.

(ආ) කොටස : සම්මුඛ පරීක්ෂණය (මේ සඳහා ලකුණු නොලැබේ.)

*12. විෂයය නිර්දේශය* :

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා ව්‍යාපෘති ඇගයීම.

මෙම ප්‍රශ්න පත්‍රයෙ හි අරමුණු වන්නේ ක්‍රමසම්පාදන මූලධර්ම සහ ක්‍රමසම්පාදන උපක්‍රම පිළිබඳව අපේක්ෂකයන්ගේ මූලික දැනුම පිරික්සීම සහ සංවර්ධන ව්‍යාපෘතීන් හඳුනාගැනීම, සැකසීම, තක්සේරු කිරීම, විපරමෙහි තබා ගැනීම සහ ඇගයීම පිළිබඳව ඔවුන්ගේ දැනුම සහ පළපුරුද්ද මැන ගැනීමය.

*13. තෝරාගැනීමේ ක්‍රමය* :

ප්‍රශ්න පත්‍රය සඳහා නියමිත ලකුණු වලින් යටත් පිරිසෙයින් 40%ක් වත් ලබා නොගන්නා අපේක්ෂකයින් කැඳවනු ලැබීමට නුසුදුසු වනු ඇත. පත්කරනු ලැබීම සඳහා අපේක්ෂකයින් තෝරා ගනු ලබන්නේ විභාගයේ 40%කට වඩා ලකුණු ලබා ගත් අයවළුන් අතරිනි.

14. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් ද, විභාගය මගින් බඳවා ගතයුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන් ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණයක් ගනු ලබන අතර, එය අවසන් තීරණය වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2008 අගෝස්තු මස 21 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

***ක්‍රමසම්පාදන කටයුතුවල නිරත නිලධාරීන් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණිය (අධිසේවක) සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2008***

(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල-2, දෙමළ-3, ඉංග්‍රීසි-4 (අදාල අංකය කොටුව තුළ ලියන්න)

01. (i) මුලකුරු සමඟ අගට යෙදෙන නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) *උදා* :- Mr./Mrs./Miss. SILVA A. L.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :——.

02. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :
(i) පුද්ගලික:———.
(ii) රාජකාරි:———.

03. ස්ත්‍රී/පුරුෂ භාවය: ස්ත්‍රී-1
පුරුෂ-0 (අදාල අංකය කොටුව තුළ ලියන්න)

04. (i) උපන් දිනය:
වර්ෂය :———. මාසය :———. දින :———.

2008.09.26 දිනට
වයස : අවුරුදු ... මාස ... දින ...

05. ජාතික හැඳුනුම්පත් අංකය:

06. ජනවර්ගය:
(ජනවර්ගයට අදාල අංකය කොටුව තුල ලියන්න)
(1) සිංහල
(2) ශ්‍රී ලාංකික දෙමළ
(3) ඉන්දිය දෙමළ
(4) මුස්ලිම්
(5) වෙනත්

07. (i) *ගැසට් නිවේදනයේ දෙවැනි ඡේදය යටතේ මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෙකු වීම පිණිස ලබා ඇති සුදුසුකම්:*

| *අමා./ප. සභා/දෙපා./ ආයතනයේ නම* | *දැරූ තනතුර* | *කාලය* | | *වාර්ෂික වැටුප* |
|---|---|---|---|---|
| | | *සිට* | *දක්වා* | |
| | | | | |

(ii) ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම්:

| *උපාධි/ ඩිප්ලෝමා විභාගය* | *වර්ෂය* | *විෂයයන්* | *පන්ති සාමාර්ථය* | *විශ්ව විද්‍යාලය හෝ ආයතනය* |
|---|---|---|---|---|
| | | | | |

(iii) සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය:
(අ) සිංහලෙන්
(ආ) දෙමළෙන්
(ඇ) ඉංග්‍රීසියෙන්

08. (අ) ඔබ ණයගැති භාවයෙන් බැඳී සිටින්නේ නම් ඒ කොපමණ ද?
(ආ) ඔබ සාපරාධී වරදකට උසාවියකින් දඬුවම් ලබා ඇත් ද?
එසේ නම් ඒ පිළිබඳ විස්තර:

09. විභාග ගාස්තු ගෙවා ලබාගත් (අලවා ඇති) කුවිතාන්සිය:
අංකය:———.
දිනය:———.
නිකුත් කළ කාර්යාලය:———.

කුවිතාන්සිය ඇලවීම සඳහා

10. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මවිසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත්, විභාගයට පෙර හෝ පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත් තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය:———.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................... මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

———.
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන.

දිනය:———.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම, ලිපිනය හා තනතුර :———.

12. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :
(රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි)

මෙම ඉල්ලුම්කරු වන ........................................ මහතා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/ ආයතනයේ ............ වැනි දින සිට සේවය කරයි. ඔහු/ඇය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත/තාවකාලික තනතුරක් දරයි. පසුගිය වසර ............ ක කාලය තුළ ඔහු/ඇය චේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද ඔහු/ඇය මොන යම් හෝ විනයානුකුල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත් කොට නොමැති බව ද, ඉහත 07 ඡේදය යටතේ සඳහන් කර ඇති සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/නොහරින බව ද .................. වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මින් සහතික කරමි.

..................................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ/
බලය පැවරූ නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව

නම :———.
පදවි නාමය :———.
දිනය :———.
දෙපාර්තමේන්තුව/ආයතනය :———.

09-1114

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.